සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වடமேல் மாகாண கல்வித் திணைக்களம் Department of Provincial Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
## Provincial Department of Education - NWP

| 7 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 15 S I |
|---|---|---|

නම: ...............................................

# ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) දෙවියන් වහන්සේ මිනිසා මවා පදිංචි කලේ,
1. පාළුකරයේ ය  2. ඔලිව් කන්දේ ය  3. එදන් උයනේ ය  4. මිටියාවතේ ය

02) ස්නාවක ජොහන්තුමාගේ දෙමාපියන් වන්නේ,
1. ආබ්‍රහම් හා සාරාය.  2. ඊසාක් හා රෙබෙකාය.
3. අකිලා හා ප්‍රිස්කිලාය.  4. සෙකරියස් හා එලිසබෙත්ය.

03) ඔබේ මවට පියාට කලයුතු දෙය වන්නේ,
1. කීකරු විය යුතුය  2. රණ්ඩු විය යුතුය
3. බොරුකිව යුතුය  4. වැරදි කල යුතුය

04) දැනීමෙන් හා ස්පර්ශ කිරීමෙන් පමණක් උත්ථානවූ ජේසුස් වහන්සේ විශ්වාස කල ගෝලයා වන්නේ,
1. පේදුරු ය.  2. ජාකොබ් ය.  3. තෝමස් ය.  4. පිලිප් ය.

05) ගෝලයන්ට ශුද්ධාත්ම බලය ලැබුනේ,
1. මහ බ්‍රහස්පතින්දා දිනයේදී ය.  2. මහ සිකුරාදා දිනයේදී ය.
3. පාස්කු දිනයේදී ය.  4. පෙන්ත කොස්ත දිනයේදී ය.

- **අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

06) මුල් කිතුනු සභාවේ තිබුණ වැදගත්ම ලක්ෂණය යාච්ඤාවය ( )

07) පේදුරු හා ජොහන් සුදර්ශන දොරටුව ලඟදී සුවකලේ අන්ධ මිනිසෙකි ( )

08) ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව තුළ ඇති පොදු ලක්ෂණ දෙකකි ( )

09) සමාරිය ස්ත්‍රිය පිළිබඳ සඳහන් වන්නේ ජොහාත් සුභාරංචියේය ( )

10) බයිබලය ලියවෙන්න වසර නවසියයක් ගත විය ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11) දස පනත ලියන ලද්දේ | වල්ගේට්ටය |
| 12) ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ ලතින් අනුවාදය | ගල්පුවරුවලය |
| 13) බුදු දහමේ ප්‍රධාන ග්‍රන්ථය | ගින්නය |
| 14) දෙවියන් වහන්සේ වැඩ සිටිමේ සංකේතයක් වන්නේ | මහබ්‍රහස්පතින්දාය |
| 15) ගෝලයන්ගේ පාද සේදූ දිනය | ත්‍රිපිටකය |

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(අස්සුන්තා, ගීතාවලිය එකසියතුන, මාටින් ලූතර්, ප්‍රඥාවේ, සියල්ල පොදුවේ තබාගැනීමය)

16) මුල් කිතුනු සභාවට පමණක් සුවිශේෂී ලක්ෂණය ........................................

17) ........................................ තාපය පූජක තුමෙකි.

18) මුහම්මද් නබිතුමාගේ දේශනා ........................................ නම් ග්‍රන්ථයේ පලවී ඇත.

19) දෙවිඳුන්ගේ ස්ථිර ප්‍රේමය ගැන සඳහන් වන්නේ ........................................ ගීතයේය.

20) දේව ගරුබිය යනු ........................................ උල්පතය. (ල.02x20=40)

## II කොටස

● පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) **කෙටි පිළිතුරු සපයන්න.**
  i. ස්නාවක ජොහන් තුමා පාළුකරයේ සිටින විට ආහාරයට ගත් දේවල් ලියන්න.
  ii. බෞද්ධ ආගමික උත්සව දෙකක් ලියන්න.
  iii. ජේස්සු වහන්සේ ඉගැන්වීම සඳහා තෝරාගත් ස්ථාන දෙකක් ලියන්න.
  iv. ජේසුස් වහන්සේ මහබ්‍රහස්පතින්දා කල විශේෂ කාර්යන් දෙකක් ලියන්න.
  v. ''පොළොං වංශය'' කියා ස්නාවක ජොහාන්තුමා ආමන්ත්‍රණය කලේ කවුරුන් හටදැයි ලියන්න.
  vi. ජේසුස් වහන්සේ සමඟ ගෙත්සෙමන උයනට ගිය ගෝලයන් දෙදෙනෙකු ලියන්න.
  vii. ඔබ සතු තලෙන්ත (හැකියා) දෙකක් ලියන්න.
  viii. ''බැටළුවා'' ගෙන් හා ''එඬේරා'' ගෙන් සංකේතවත් කරන්නේ කුමක්දැයි ලියන්න. (ල.2x8=16)

02) i. දෙවියන් වහන්සේ මිනිසාට ලබාදුන් වගකීම් දෙකක් ලියන්න. (ල.02)
  ii. මිනිසා විසින් දේවමැවිල්ල විනාශ කරන අවස්ථා තුනක් ලියන්න. (ල.03)
  iii. මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කල හැකි දේවල් හයක් ලියන්න. (ල.06)

03) i. ජේසුස් වහන්සේ පාළුකරයේ ගතකල දින ගණන කීයද? (ල.02)
  ii. පාළුකරයේ සිටින විට ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා තුන ලියන්න. (ල.03)
  iii. එදිනෙදා ජීවිතයේදී ඔබට පැමිණෙන ප්‍රශ්න හා ගැටලු අවස්ථාවෙලදී ශුද්ධාත්ම දිරිය හා සවිය ඉල්ලා කරන යැදුමක් ලියන්න. (ල.06)

04) i. සභාව යනු කුමක්දැයි ලියන්න. (ල.02)
  ii. මුල් කිතුනු සභාවේ ලක්ෂණ තුනක් ලියන්න. (ල.03)
  iii. කිතුනු දරුවකු වන ඔබ දේව නමස්කාරය සඳහා රැස්වීමේ වැදගත්කම පේළි හයකින් විස්තර කරන්න.(ල.06)

05) i. ක්ලෞදියස් රජුගේ කාලයේ ලොව පුරා සාගතයක් ඇතිවූ බව බයිබලයේ සඳහන් කරන පොත ලියන්න.(ල.02)
  ii. සමාජයේ ඇති විපත් තුනක් ලියන්න. (ල.03)
  iii. සමාජ අවශ්‍යතා ඉදිරියේ ඔබ ක්‍රියාකරන ආකාර 06 ක් ලියන්න. (ල.06)

06) i. කිතුනුවන්ගේ හා ඉස්ලාම් බැතිමතුන්ගේ පූජනීය ග්‍රන්ථ ලියන්න. (ල.02)
  ii. හින්දු ආගමිකයන් වන්දනා කරන දෙවිවරු තිදෙනකු ලියන්න. (ල.03)
  iii. කිතුනු දරුවකු වන ඔබ නත්තල වෙනුවෙන් කරන දේවල් 06 ක් ලියන්න. (ල.06)